# කෘෂිකර්ම අමාත්‍යාංශය

**පසුගාමී ග්‍රාමීය ප්‍රදේශ සංවර්ධන හා ගෘහාශ්‍රිත සත්ත්ව පාලන සහ සුළු ආර්ථික බෝග වගා ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය**

# ශ්‍රී ලංකා හදබිම අධිකාරිය

## ශ්‍රී ලංකා හදබිම අධිකාරියේ පහත තනතුරු පිරවීම සඳහා ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ

### 01. තනතුර : කලාප නිලධාරී - II ශ්‍රේණිය
**පුරප්පාඩු තනතුරු සංඛ්‍යාව : 01**

01. **අධ්‍යාපන සුදුසුකම් :**

i. බාහිර බඳවා ගැනීමකදී
පිලිගත් විශ්වවිද්‍යාලයක කෘෂිකර්ම උපාධියක් ලබා තිබීම.

ii. අභ්‍යන්තර බඳවා ගැනීමක දී
a) ශ්‍රී ලංකා හදබිම අධිකාරියේ කළමනාකරණ සහකාර (තාක්ෂණ) සේවා ගණයේ (MA 2-1 වැටුප් පරිමාණයේ) I ශ්‍රේණියේ සතුටුදායක සේවා කාලයක් සහිත වීම. හා
b) එම ශ්‍රේණියේ වසර පහකට නොඅඩු සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

iii. **වයස් සීමාව :**
අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවු. 22 ට නොඅඩු අවු. 35 ට නොවැඩි අය විය යුතුය. (අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා වයස් සීමාවක් බල නොපැවැත්වේ)

iv. **සේවා ගණයට අදාළව වැටුප් කේත අංකය හා මාසික වැටුප් පරිමාණය :**
JM 1-1 : රු. 42600 – 10x755 – 18x1,135 – 70580 වේ.

### 02. තනතුර : කළමනාකරණ සහකාර (තාක්ෂණික) III ශ්‍රේණිය
**පුරප්පාඩු තනතුරු සංඛ්‍යාව : 04**

i. **අධ්‍යාපන සුදුසුකම් :**

★ බාහිර බඳවා ගැනීමකදී
තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතා (N.V.Q. Level 5) මට්ටමට අඩු නොවන්නා වූ කෘෂිකර්ම ක්ෂේත්‍රයේ තාක්ෂණික පාඨමාලාවක් හදාරා සහතික ලබා තිබීම.

ii. **වයස් සීමාව :**
අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවු. 22 ට නොඅඩු අවු. 45 ට නොවැඩි අය විය යුතුය. (අභ්‍යන්තර අයදුම්කරුවකුට උපරිම වයස් සීමාව අදාළ නොවේ)

iii. **සේවා ගණයට අදාළව වැටුප් කේත අංකය හා මාසික වැටුප් පරිමාණය :**
MA 2-1 : රු. 30310 – 10x300 – 7x350 – 4x495 – 20x660 – 50940 වේ.

### 03. තනතුර : කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන) III ශ්‍රේණිය
**පුරප්පාඩු තනතුරු සංඛ්‍යාව : 04**

i. **අධ්‍යාපන සුදුසුකම් :**
අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී සිංහල / ගණිතය ඇතුළුව සම්මාන 04 ක් සමග දෙවරකට නොවැඩි වාර ගණනකදී විෂයයන් හයක් (06) සමත් වී තිබීම. හා
අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ දී විෂයයන් 03 ක් සමත්ව තිබීම.

ii. **වයස් සීමාව :**
අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවු. 22 ට නොඅඩු අවු. 45 ට නොවැඩි අය විය යුතුය. (අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා වයස් සීමාවක් බල නොපැවැත්වේ)

iii. **සේවා ගණයට අදාළ වැටුප් කේත අංකය හා මාසික වැටුප් පරිමාණය :**
MA 1-1 : රු. 27910 – 10x300 – 7x350 – 4x495 – 20x660 – 48540 වේ.

### සේවා නියුක්ත කිරීමේ කොන්දේසි

තුන් අවුරුදු පරිවාස කාලයකට යටත්ව ස්ථිර තනතුරු සඳහා බඳවා ගනු ලැබේ. සේවක අර්ථසාධක අරමුදලට වැටුපෙන් 8% ක් සේවකයා විසින් ගෙවිය යුතු අතර, අධිකාරිය විසින් 12% ක මුදලක් ගෙවනු ලැබේ. සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල සඳහා අධිකාරිය විසින් වැටුපෙන් 3% මුදලක් ගෙවනු ලැබේ.

ශ්‍රී ලංකා හදබිම අධිකාරියේ ප්‍රධාන කාර්යාලය මහනුවර පේරාදෙණියේ පිහිටා ඇති අතර, වෙනත් ශාඛා කාර්යාල නොමැති බැවින් කළමනාකරණ සහකාර (තාක්ෂණ නොවන) තනතුරුවල නිලධාරීන්ගේ සේවා ස්ථානය එම කාර්යාලය පමණක් වේ.

තේරී පත්වණු ලබන කලාප නිලධාරීන් හා කළමනාකරණ සහකාර (තාක්ෂණ) තනතුරුවල නිලධාරීන් රාජකාරී අවශ්‍යතාව මත මුළු දිවයින පුරා සේවයේ යෙදීමට එකඟවිය යුතු වේ.

ඉහත සඳහන් පුරප්පාඩු සඳහා සුදුසුකම් ලත් අයදුම්කරුවන් 2021.02.08 දින හෝ ඊට පෙර මේ සමග ඇති ආදර්ශ අයදුම්පත මගින් පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් ඉල්ලුම් කළ යුතු අතර, අයදුම්පත් බහාලන ලිපි කවරයේ "වම්පස ඉහළ කෙළවරේ" ඉල්ලුම් කරනු ලබන තනතුර සඳහන් කළ යුතුය. අවශ්‍ය සුදුසුකම් සපුරා නොමැති අයදුම්පත් හා ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඒ බව අයදුම්කරුවන්ට දැනුම් දෙනු නොලැබේ.

දැනටමත් රාජ්‍ය සේවයේ නියුතු වූවන් ඉල්ලුම් කරන්නේ නම් ආයතන ප්‍රධානීන් මගින් ඉල්ලුම් කළ යුතු අතර, මේ පිළිබඳ වැඩි විස්තර ශ්‍රී ලංකා හදබිම අධිකාරියේ පහත දුරකථන අංකයෙන් විමසිය හැකිය.

**දුරකථන අංකය : 081-2388107**

**සභාපති - ශ්‍රී ලංකා හදබිම අධිකාරිය,**
**තැ.පෙ. 09, ගන්නෝරුව පාර, පේරාදෙණිය.**

**දිනය : 2021.01.20**

## ............................................ තනතුර සඳහා අයදුම්පත

01. මුලකුරු සමග නම : ..........
02. සම්පූර්ණ නම : ..........
03. ස්ථිර ලිපිනය : ..........
04. උපන් දිනය : ..........
05. පදිංචි දිස්ත්‍රික්කය : ..........
06. වයස : අවු : .......... මාස : .......... දින : ..........
(2021.01..... දිනට)
07. හැඳුනුම්පත් අංකය : ..........
08. විවාහක / අවිවාහක බව : ..........
09. දුරකථන අංකය : ..........
10. අධ්‍යාපන සුදුසුකම් : ..........

අ.පො.ස. (සාමාන්‍ය පෙළ)

| | විෂය | ශ්‍රේණිය | | විෂය | ශ්‍රේණිය |
|---|---|---|---|---|---|
| 01. | | | 06. | | |
| 02. | | | 07. | | |
| 03. | | | 08. | | |
| 04. | | | 09. | | |
| 05. | | | 10. | | |

අ.පො.ස. (උසස් පෙළ)

| | විෂය | ශ්‍රේණිය |
|---|---|---|
| 01. | | |
| 02. | | |
| 03. | | |
| 04. | | |

11. උසස් අධ්‍යාපන සුදුසුකම් :
..........
..........
..........

12. වෘත්තීය සුදුසුකම් :
..........
..........
..........

13. වෙනත් සුදුසුකම් :
..........
..........
..........
..........

මා විසින් ඉහත සඳහන් කර ඇති කරුණු මාගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට සත්‍ය හා නිරවද්‍ය බවට මෙයින් සහතික කරමි.

දිනය : .......... අයදුම්කරුගේ අත්සන : ..........